පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12. පැය 1445 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1870/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**2024 නත්තල් උත්සවය හා 2025 නව වසර උදාව වෙනුවෙන් ආරක්ෂක හා රථවාහන රාජකාරි සඳහා නිලධාරින් යෙදවීම.**

2024 නත්තල් උත්සවය හා 2025 නව වසර උදාව වෙනුවෙන් විවිධ අවශ්‍යතාවයන් සඳහා මහජනතාව විශාල වශයෙන් ප්‍රධාන නගර හා තදාසන්න ප්‍රදේශ වෙත පැමිණීම සිදුවන අතර, නත්තල් උත්සවයේ කතෝලික දේවස්ථාන ආශ්‍රිතව සිදු කෙරෙන දේව මෙහෙයන් ඇතුළු විවිධ ආගමික කටයුතු සඳහා බැතිමතුන් විශාල වශයෙන් පැමිණීම අපේක්ෂා කරනු ලබයි.

එසේ පැමිණෙන මහජනතාවගේ හා බැතිමතුන්ගේ ආරක්ෂාව සහ රථවාහන පාලනය සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි උත්සව සමයේ මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන දේවස්ථාන, වෙළඳසැල් ඇතුළු තදබදයන් පවතින පොදු ස්ථාන ආවරණය වන පරිදි පොලිස් නිලධාරීන් 40,000 කට අධික සංඛ්‍යාවක් යෙදවීමට කටයුතු කර ඇත.

ඒ අනුව ප්‍රධාන වශයෙන් කොළඹ නගරය කේන්ද්‍ර කොටගෙන බස්නාහිර පළාත තුල විශේෂ ආරක්ෂක හා රථවාහන සැලැස්මක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම උත්සව කාලසීමාව තුල, කාන්තා නිලධාරිණියන් 553 ක්, රථවාහන රාජකාරි සඳහා නිලධාරින් 600 කට අධික නිලධාරීන් සංඛ්‍යාවක් ඇතුළු පොලිස් නිලධරයන් 6500 කට අධික ප්‍රමාණයක් රාජකාරි යෙදවීමට පොලිස් මූලස්ථානය කටයුතු කර ඇත. එහිදී මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන ස්ථාන ආශ්‍රිතව නිල ඇඳුමට අමතරව සිවිල් ඇඳුමින් සැරසුණු නිලධාරින් හා නිලධාරිණියන් 500කට අධික ප්‍රමාණයක් මෙන්ම බුද්ධි අංශ නිලධාරින් ද රාජකාරි යෙදවීම සිදු කරන අතර එම රාජකාරි අධීක්ෂණය සඳහා උසස් නිලධාරීන් 48 දෙනෙකු හා පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් 769 දෙනෙකු රාජකාරි යෙදවීමට කටයුතු කර ඇත.

දිවා රාත්‍රී ආවරණය වන පරිදි බුද්ධි අංශ නිලධාරීන් යොදවා තොරතුරු ලබා ගෙන ජනාකීර්ණ ස්ථාන ආශ්‍රිතව ගැවසෙන සොරුන් සහ ගැට කපන්නන් ඇතුළු විවිධ අපරාධකරුවන් වහාම අත්අඩංගුවට ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මකව පවතී.

උත්සව සමයේ තම අවශ්‍යතා සඳහා ගමන් කිරීමේදී දැඩි අවධානයෙන් පසු වන ලෙසත්, මාර්ග නීති රීති වලට අවනතව ක්‍රියාකරන ලෙසටත්, පොලිසිය මහජනතාවගෙන් හා රියදුරන්ගෙන් ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**